# විද්‍යාර්ථීන්ගේ සමාජ ජාල වෙබ් අඩවි භාවිතයේ අරමුණු
## ( කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

ඩබ්.එන්.ඩී.එස්. සම්මානි වෙදමුණි[1]

**සංක්ෂේපය**

කැලණිය විශ්වවිද්‍යාලය තුළ විද්‍යාර්ථීන් විසින් සමාජ ජාල වෙබ් අඩවි භාවිතා කිරීම බහුල වශයෙන් දක්නට ලැබෙන්නකි. මෙයට ප්‍රධාන හේතූන් මොනවාද යන්න සොයා බැලීම සඳහා මෙම පර්යේෂණය සිදු කරන ලදී. කැලණිය විශ්වවිද්‍යාලය පරිශ්‍රය තුළ දැනට පවතින විද්‍යා, වානිජ හා කළමණාකරණ, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයන්ගේ විද්‍යාර්ථීන් අතරින් දෙවන වසර සිසුන් 100ක නියැදියක් යොදාගනිමින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. මෙහිදී දත්ත ලබාගැනීම සඳහා ප්‍රාථමික දත්ත ලබාගැනීමේ ක්‍රම වන සම්මුඛ සාකච්ඡා ක්‍රමය හා ප්‍රශ්නාවලි ක්‍රමය යොදාගන්නා ලදී. මෙම පර්යේෂණය විශ්ලේෂණය කිරීම සඳහා සංඛ්‍යාත්මක ශිල්පීය ක්‍රම යොදාගත් අතර ප්‍රතිපායනය, සහසම්බන්ධතාවය, කේන්ද්‍රීය ප්‍රවණතා මිනුම් මෙන්න කුටිකතාවය, විචලතාවයද භාවිතා විය. වාණිජ හා කළමණාකරණ, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා යන සියලු පීඨයන්ගේ 72%ක විද්‍යාර්ථීන් පිරිසක් සමාජ ජාල වෙබ් අඩවි භාවිතය යෝග්‍ය බව ප්‍රකාශ කරන අතර විද්‍යා පීඨයේ සුළු පිරිසක් එනම් 25% යෝග්‍ය නොවන බව ප්‍රකාශ කරන ලදි. 3% කිසිසේත්ම සමාජ ජාල වෙබ් අඩවි භාවිතය සුදුසු නොවන බව පවසයි. තවද මොවුන්ගෙන් විශාල පිරිසක් මෙම සමාජ ජාල වෙබ් අඩවි තුල තමන්ගේ පෞද්ගලික තොරතුරු ඇතුලත් නොකරන බවත්, මේවා භාවිතා කරනු ලබන්නේ හුදෙක්ම විනෝදාස්වාදය සඳහා පමණක් බවත් ප්‍රකාශ කර සිටී. වාණිජ හා කළමණාකරණ විද්‍යාර්ථීන්ගෙන් සමාජ ජාල වෙබ් අඩවි ඉතාමත් යෝග්‍ය බව 5% පිරිසක් ප්‍රකාශ කරන ලද අතර 23% යෝග්‍ය නොවන බව පවසයි. මානව ශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයන්හි 28% සමාජ ජාල වෙබ් අඩවි යෝග්‍ය නොවන බව පවසයි. මෙම පර්යේෂණය මඟින් පෙනී ගිය නිගමනය වන්නේ සියලුම පීඨයන්හි විද්‍යාර්ථීන් සමාජ ජාල වෙබ් අඩවි කෙරේ යොමු වී ඇති බවත්, ඉතා සීමිත පිරිසක් එය ප්‍රතික්ෂේප කරන බවත්ය. මෙම පර්යේෂණය මඟින් විශ්වවිද්‍යාලය තුල විද්‍යා පීඨයේ විද්‍යාර්ථීන් වැඩි වශයෙන් සමාජ ජාල වෙබ් අඩවි භාවිතා කරන අතර එය යෝග්‍යබව ප්‍රකාශ කර සිටී.

**මුඛ්‍ය පද :** *විද්‍යාර්ථයා, පර්යේෂණ, සමාජ ජාල වෙබ් අඩවි*

---

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
wedamunisammani@gmail.com